ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය 563

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන- 3 වන මට්ටම

**2022/2023 අවසාන පරීක්ෂණය**

**EPU3235 - විෂයමාලා අධ්‍යයනය සහ ප්‍රායෝගික වැඩ - පරිසර අධ්‍යයනය**

**කාලය - පැය දෙකයි. (02)**

---

**දිනය - 2024.02.10** **වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා**

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 01 - වන කොටස

01. පරිසරය යන යෙදුම ඔබේම වචන වලින් නිර්වචනය කරන්න.

02. මුල් ළමාවියේ දී දරුවා පරිසරය සහ එහි සංවර්ධනය හඳුනා ගන්නා ආකාර කෙටියෙන් පැහැදිලි කරන්න.

03. සන්නිවේදනය යන පදය පැහැදිලි කරන්න.

04. "ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනයේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය වැදගත් විෂයයක් ලෙස සලකනු ලැබේ". මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද ඔබේ පිළිතුර සාධාරණීයකරණය කරන්න.

05. අපේ පරිසරය ආරක්ෂා කිරීම සඳහා සිසුන්ගේ කාර්යභාරය කුමක්ද? ඔවුන්ට එයට දායක විය හැක්කේ කෙසේද?

06. ගෝලීය පාරිසරික ගැටළු හතරක් (04) ලැයිස්තු ගත කර කෙටියෙන් පැහැදිලි කරන්න.

07. "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයට සමෝධානිත ලක්ෂණ ඇත". ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

08. අපගේ දෛනික චර්යාව සමඟ සන්නිවේදනය සම්බන්ධ වන්නේ කෙසේද?

(ලකුණු 5x8 = 40)

## 02- දෙවන කොටස

09. (i.) පහත සඳහන් පද පැහැදිලි කරන්න.
    (අ) භෞතික පරිසරය
    (ආ) ජෛව පරිසරය (ලකුණු 04)

(ii.) පරිසර පද්ධතියක් ලෙස ජීවී සහ අජීවී සාධක අතර, සම්බන්ධය කුමක්ද? (ලකුණු 04)

(iii.) ප්‍රාථමික පාසල් ගුරුවරයකු ලෙස ඔබ පරිසරය සුරැකීමට දායක විය හැක්කේ කෙසේද? (ලකුණු 12)

10. (i.) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල්වල පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයෙහි ඓතිහාසික වර්ධනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය අනෙක් විෂයන්ගෙන් වෙනස් වේ" ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

(iii.) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයෙන් තේමාවක් තෝරාගෙන එහි එය සංවර්ධනය කර ඇති විෂය ක්ෂේත්‍ර විස්තර කරන්න. (ලකුණු 08)

11. (i.) සන්නිවේදන ක්‍රියාවලියේ මූලික කාර්යයන් මොනවාද? (ලකුණු 04)

(ii.) අධ්‍යාපනික තාක්ෂණික විෂය හා පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය අතර සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) සන්නිවේදනය වර්ධනය කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රියාකාරකමක් යෝජනා කරන්න. ඔබ යෝජනා කළ ක්‍රියාකාරකම විස්තර කරන්න. (ලකුණු 10)

12. ප්‍රාථමික අවධියේ සියලුම විෂයන් ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියේ දී තක්සේරු කිරීම සහ ඇගයීම ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

(i.) වැදගත් කරුණු **හතරක්** (04) සමඟ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයෙහි තක්සේරු කිරීම සහ ඇගයීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii.) පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය සඳහා උචිත තක්සේරු කිරීම සහ ඇගයීමේ ක්‍රම **හතරක්** (04) ලැයිස්තු ගත කර අදාල උදාහරණ සමඟ පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. අපගේ එදිනෙදා ජීවිතයේ සුළු වෙනස්කම් කිහිපයක් ගෝලීය ගැටළු, එනම් ගෝලීය උණුසුම්වීම වැනි සහ දේශීය ගැටළු එනම්, අප ද්‍රව්‍ය බැහැර කිරීම, බල ශක්ති අර්බුදය, ඉඩම් පිරිහීම (degradation) සහ ජල හිඟය වැනි ගෝලීය ගැටළු කිහිපයක් විසඳීමට උපකාරී වනු ඇත.

(i.) ගෝලීය ආරක්ෂාව සඳහා ඔබට කළ හැකි කුඩා වෙනස්කම් **පහක්** (05) පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ii.) "තක්සේරුකරණය යනුවෙන් අදහස් කරනුයේ සිසුන්ගේ කාර්යයන් සඳහා හරි හෝ වැරදි ලකුණු කර, ශ්‍රේණි ලබාදීම පමණක්ම නොවේ. පන්ති කාමර තුළ පරිසර විෂය තක්සේරු කිරීමේදී එය සිදුකිරීමට බලාපොරොත්තු වේ"

පරිසර විෂය තක්සේරුකරණයේදී සිසුන් එකිනෙකා සංසන්දනය කිරීමේ අයහපත් බලපෑම් **හතරක්** (04) ලියන්න. (ලකුණු 10)

සියළුම හිමිකම් ඇවිරිණි.